පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂයය:- පෙරදිග සංගීතය

සතිය :- 19

ශ්‍රේණිය :- 10

Prepared by- H.D.V.K.C.Ilangarathna
(Music Teacher:- Ke/Dehi/Gonagala K.V.

## ග්‍රැමෆෝන් තැටි ගී යුගය හා ගීත හඳුනා ගනිමු - 01

***පහත තොරතුරු පත්‍රිකාව කියවන්න.**

විසිවන සියවසේ පළමු දශකය තුළ(1903) දී ලංකාවට පැමිණි ග්‍රැමෆෝනය 1960 දශකයෙන් පසු සාමාන්‍ය භාවිතයෙන් ඉවත් විය. සිංහල ග්‍රැමෆෝන් තැටි ගීත ලෙස මුලින් ම තැටිගත කරන ලද්දේ නූර්ති ගීත ය. සිරිසඟබෝ, ශ්‍රී වික්‍රම , රාමායනය , සකුන්තලා , උත්තර රාම වැනි නූර්ති වල දන්නෝ බුදුන්ගේ, ශ්‍රියා මනමත් වී , හරිම් රජ සැපා, දේවනේ ලෝකපති , පිපිලා දැ සමන් ආදී නූර්ති ගීත ඊට අයත් විය. විශ්වනාත් ලව්ජි වැනි සංගීතඥයින් සංගිත නිර්මාණය කර ඇති අතර චාල්ස් පෙරේරා, ඈනී රොම්ලස්, එච්.ඩබ්ලිව් පෙරේරා, ඈනී බොතේජු, ඩී මාර්ෂල් පෙරේරා වැනි ගායක ගායිකාවන් ගීත ගයා ඇත.

ඉහත ගීත වලට අමතර ව හින්දි, ද්‍රවිඩ , ඉංග්‍රීසි ගී තනු පාදක කරගත් අනුකාරක ගීත ඇතුළත් හින්දි ගීතනු යුගයේ ගීත වල නාදමාලාව ප්‍රමුඛ වූ අතර ආකර්ෂණීය විය.

***හින්දි තනු අනුකාරක ගීත***

*දුල් සල් වනේ ලකල් - වල් වල්තෙ නෞ ජවාන් *මහා බෝධිමුලේ - අබ තේරෙ සිවා

*ප්‍රේම දයාබර ස්වාමී - කෝන තුජේ සම්ජායේ *සිරි බුද්ධගයා විහාරේ - ක්‍යූ හමාත් පිරේ

**ගායක ගායිකාවන්**

*ග්‍රේටා ජෙනට් ද සිල්වා *එච් ඩබ්ලිව් රූපසිංහ *එන් රොම්ලස් *ජේ සාදිරිස් සිල්වා

*රුක්මනී දේවී *එඩී ජයමාන්න

***ක්‍රියාකාරකම***

01. ඉහත සටහන සංගීතය සටහන් පොතේ සටහන් කරගන්න.

02. සටහන හොඳින් කියවා අවබෝධ කර ගන්න.

03. ඉහත සඳහන් නූර්ති ගිත යූ ටියුබ් / අන්තර්ජාලය මගින් ශ්‍රවනය කරන්න.

04. ඉහත සඳහන් හින්දි තනු අනුකාරක ගිත යූ ටියුබ් / අන්තර්ජාලය මගින් ශ්‍රවනය කරන්න.

05. ඔබ කැමති අනුකාරක ගීතයක් ගායනය කරමින් ප්‍රායෝගිකව පුහුණුවන්න.